# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1654/9 - 2010 මැයි 19 වැනි බදාදා - 2010.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

64 (1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 64 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මම, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන දඹවෙල, ඇල්හේන, මාලිගාවත්ත, සරසවිගම, ඔගස්ටාවත්ත, උඩබෝවල, මහකන්ද, හිඳගල හා උඩපේරාදෙණිය යන ප්‍රදේශවල ජල සැපයීම් කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63(1) වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධිවිධාන මෙම නියමය මගින් මෙහි උපලේඛනයේ ඇතුළත් කරමි.

දිනේෂ් ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2010 මැයි මස 14 වැනි දින,
අංක 34, නාරාහේන්පිට පාර, නාවල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

61 (1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යොජනා ක්‍රමයේ ඇතුළත් දේ :

(අ) පහත දැක්වෙන සියළුම චංචල හා නිශ්චල දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය වෙත සතු කළ යුතුය. එනම්,

(i) මහනුවර කඩවත් සතර සහ ගඟවට කොරළේ ප්‍රාදේශීය සභාව යටතේ ඇති දඹවෙල, ඇල්හේන, මාලිගාවත්ත, සරසවිගම, ඔගස්ටාවත්ත, උඩබෝවල, මහකන්ද, හිඳගල හා උඩපේරාදෙණිය යන ප්‍රදේශවල ජල සම්පාදන ක්‍රමයන්ට අයත් සියළුම ජල මූලාශ්‍ර, සේවා ජලාශ, ජල පවිත්‍රාගාර, පීඩන ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම ඉඩම්, ගොඩනැගිලි, ජල නල, සියළුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවිකිරීමේද, ඒ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියළුම අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය.

1A - G 12860 — 350 (2010/05)

(ii) මෙම ජල සම්පාදන ක්‍රමයන් තුළ පිහිටි ජල බෙදාහැරීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය ජලනල මාර්ගවල පරවශතාවයන්, අමතර කොටස්, අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය සමග සියළුම ප්‍රධාන ජල නල බෙදාහැරීමේ ජල නල මාර්ග.

(ආ) ඉහත සඳහන් දේපළ හා සම්බන්ධ සැළසුම් කිරීම්, සැපයීම්, සවිකිරීම්, ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තු ද සභාවේ අයිතිවාසිකම්, බැදීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඇ) ජලය භාවිතා කිරීම හා ජල සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයන් සමග මහනුවර කඩවත් සතර සහ ගඟවට කොරළේ ප්‍රාදේශීය සභාව බැඳී ඇති සියළුම ගිවිසුම් ද, ඒ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් කළ යුතු ගෙවීම් ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 3,411,900.00 ක් (තිස්හතර ලක්ෂ එකොලොස් දහස් නවසියයක්) වටිනා මේ පහසුකම්වල වත්කම්, අධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රධානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව ඇතුළත් වූ සියළුම ගිවිසුම් මණ්ඩලය විසින් නොකඩවා පවත්වා ගෙන යනු ලබන අතර, ගිවිසුම් සපුරාලීම ද කරනු ලැබේ.

ඉහත පැවැරුම මෙම නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

06 - 24

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.